# CHERAG NILGIRIYA

**Attorney-at-Law**

No. 19, Union Place, Colombo 02.     Mobile No.; 077-9703937     Email; cheragnilgiriya@gmail.com

2025-5-18

ගරු අධ්‍යක්ෂක ජෙනරාල්තුමා,
අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව,
අංක 36, මළලසේකර මාවත,
කොළඹ 7.

ගරු අධ්‍යක්ෂක ජෙනරාල්තුමණි,

මාගේ සේවාදායක වන රාජගිරිය. රාජගිරිය උද්‍යානය, 1 වන පටුමග, අංක 623/19 හි පදිංචි මහින්දානන්ද අලුත්ගමගේ යන අයගේ උපදෙස් මත මෙම ලිපිය ලියමි.

**2025-5-16** වන දින ජනමාධ්‍යයෙන් හෙළිදරව් වූ පුවතක් වූයේ මාගේ සේවාදායක වන මහින්දානන්ද අලුත්ගමගේ යන අය අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව වෙත ප්‍රකාශයක් ලබාදීමට නොපැමිණීම යන පදනම මත කොළඹ මහේස්ත්‍රාත් අධිකරණය විසින් වරෙන්තුවක් නිකුත් කොට ඇති බවයි.

මේ සම්බන්ධයෙන් පහත දැක්වෙන සිද්ධිමය කරුණු කෙරෙහි ඔබගේ අවධානය යොමුකර සිටිමි.

ජනමාධ්‍යයෙන් ප්‍රකාශ වන ආකාරයට මෙම වරෙන්තුව අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව විසින් අයැද ඇත්තේ දැනට පවතින විමර්ශනයක් වශයෙන් හඳුන්වා ඇති කාබනික පොහොර ආනයනය කිරීමේදී ඇති වූ අක්‍රමිකතාවයක් සම්බන්ධයෙන් වන විමර්ශන කටයුත්තකි. මෙම විමර්ශන කටයුත්තේ කිසිදු අවස්ථාවක මාගේ සේවාදායකව සැකකරුවෙකු වශයෙන් නම් කොට නොමැති අතර, මුලින්ම අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව විසින් ගරු අධිකරණයට සැකකරුවෙකු වශයෙන් ඉදිරිපත් කරනු ලැබුවේ මහේෂ් ගම්මන්පිල යන කාබනික පොහොර නිෂ්පාදන ප්‍රවර්ධන හා සැපයුම් නියාමන රාජ්‍ය අමාත්‍යාංශයේ අතිරේඛ ලේකම් (සංවර්ධන) ධූරයේ කටයුතු කළ යන අයෙකි. මුල් අවස්ථාවේදී ඔහුව රක්ෂිත බන්ධනාගාරගත කරන්නට යෙදුණු අතර, ඉන් අනතුරුව **2025-5-05** දින ඔහුට ඇප ලබාදීම සිදුකරන ලදි. එම ඇප ප්‍රදානය කරනු අවස්ථාවේදී මාගේ සේවාදායක අදාල කාලපරිච්ඡේදය තුළදී කෘෂිකර්ම ඇමතිවරයා වශයෙන් කටයුතු කල බව සඳහන් කරමින් ඔවුන් සම්බන්ධයෙන්ද විමර්ශන කටයුතු කිරීමට අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව බලාපොරොත්තු වන බවට ගරු අධිකරණයේදී එම කොමිෂම වෙනුවෙන් පෙනී සිටි උගත් නීති නිලධාරීතුමිය විසින් ගරු අධිකරණයට ප්‍රකාශ කරන්නට යෙදුණි.

එම පදනම මත මාගේ සේවාදායක හට මුලින්ම මෙම විමර්ශනය සඳහා ප්‍රකාශයක් වාර්තාගත කිරීමට **2025-5-14** දින පැමිණෙන මෙන් අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව විසින් දන්වා තිබුණි. ඒ අනුව මාගේ සේවාදායකගේ උපදෙස් ප්‍රකාරව **2025-5-14** දින පෙ.ව.9 ට පමණ මා අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ විශේෂ විමර්ශන ඒකකය වෙත ලිපියක් ඉදිරිපත් කරමින් මාගේ සේවාදායක හට ඒදින පැමිණීමට නොහැකි බවත්, ඊට හේතුව වශයෙන් මෙම විමර්ශනය ආශ්‍රිතව ලිපි ලේඛන රැසක් ඇති බවත්, එම ලේඛන සොයා ගැනීමට කාලයක් අවශ්‍ය බවත් දන්වා ප්‍රකාශය ලබාදීමට වෙනත් දිනයක් ඉල්ලා සිටින ලදි.

එහිදී ඔවුන් විසින් තමන් හඳුන්වා දුන් පරිදි අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ නිලධාරී මහතුන් වන පොලස් පරීක්ෂක මධුක සහ ප්‍රධාන පොලස් පරීක්ෂක රණසිංහ යන අය විසින් එම ලිපිය භාර ගන්නා ලද අතර එකී ලිපියේ අන්තගර්ගත කරුණු සලකා බැලීමෙන් අනතුරුව මාගේ සේවාදායක හට **2025-5-14** වන දින පැමිණීම අවශ්‍ය නොවන බවත්, **2025-5-19** වන දින අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවට පැමිණ ප්‍රකාශයක් ලබා දෙන ලෙසත් එකී නිලධාරී මහතුන් විසින් දන්වා සිටින ලදි.

ඉන් අනතුරුව මාගේ සේවාදායක විසින් අංක 45553/1/25 දරණ අපේක්ෂිත ඇප ඉල්ලුම්පත්‍රය **2025-5-14** දින කොළඹ ප්‍රධාන ගරු මහේස්ත්‍රාත් අධිකරණයේ ගොනු කිරීමෙන් අනතුරුව එම නඩුව ඒදිනම කැඳවා කරුණු තහවුරු කිරීම සඳහා **2025-5-19** දින ගරු අධිකරණය විසින්

ලබාදෙන ලදි. එම අපේක්ෂිත ඇප ඉල්ලීම මාගේ සේවාදායක විසින් ගොනු කර ඇත්තේ **දූෂණ විරෝධී පනතේ 149 වගන්තිය සමග කියවිය යුතු 1997 අංක 30** දරණ ඇප පනතේ 21 වන වගන්තිය යටතේය. එවන් ඉල්ලීමක් සිදුකිරීමට ඕනෑම පුද්ගලයෙකුට ව්‍යවස්ථාපිත අයිතියක් ඇති අතර, මෙහිදී මාගේ සේවාදායක විසින් සිදුකොට ඇත්තේ නීතියෙන් ලබා දී ඇති ව්‍යවස්ථාපිත අයිතිවාසිකමක් ක්‍රියාත්මක කිරීම පමණි.

ඉන් අනතුරුව එදිනම පස්වරු 1.13 හෝ ඊට ආසන්න වේලාවකදී 0112 596360 දුරකතන අංකයෙන් මා වෙත දුරකතන ඇමතුමක් ලබා දෙමින් අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ නිලධාරී මහත්මියක් මා වෙත දන්වා සිටින ලද්දේ මාගේ සේවාදායක විසින් ගරු අධිකරණයේ අපේක්ෂිත ඇප ඉල්ලීමක් ගොනු කර ඇති බවත් එහෙයින් **2025-5-19** වන දිනද කොමිෂන් සභාවේ පැමිණීමට අවශ්‍ය නැති බවත්, කොමිෂන් සභාව විසින් නැවත දැනුම් දෙනු ලැබූ විට ප්‍රකාශයක් ලබා දීම සඳහා පැමිණෙන ලෙසට මාගේ සේවාදායකව දැනුවත් කරන ලෙසත් ය.

ඉහත තත්වයන් තුළ මා විසින් සඳහන් කරන්නට යෙදුණු ඉහත සිද්ධිමය කාරණා යුක්තිය පසිඳලීමේ ක්‍රියාවලියේදී මාගේ සේවාදායකට අගතිදායක ලෙස බලපා ඇති අතර මේ සම්බන්ධයෙන් කරුණු විමර්ශනය කොට නිසි ක්‍රියාමාර්ග ගනු ඇතැයි අපේක්ෂා කර සිටිමි.

මේ සම්බන්ධයෙන් ඉදිරියේදී අදාළ අධිකරණ වලට කරුණු ඉදිරිපත් කිරීමට බලාපොරොත්තු වන බවද මෙයින් දන්වමි.

ස්තූතියි.

මෙයට - විශ්වාසී,

(signature)

..........................................
නිහිඬ චෙරාග් නිල්ගිරිය

CHERAG NILGIRIYA
ATTORNEY - AT - LAW
NO. 19, UNION PLACE,
COLOMBO 02.

Scanned with CamScanner